00057

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනපති උපාධි වැඩසටහන

අවසාන පරීක්ෂණය - 2018/2019

**ESP2312/STP9812**- අධ්‍යාපනයේ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක පදනම

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2019.03.17 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

01. (i) "දේශපාලන සමාජානුයෝජනය" යන සංකල්පයෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(ii) අධ්‍යාපනය හා දේශපාලනය අතර සම්බන්ධතාව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(iii) දේශපාලන සමාජානුයෝගී කාරක තුනක් (03) නම් කර, ඉන් එකක් පිළිබඳව ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 17)

02. (i) අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරිත්වයන් හඳුනාගෙන, එක් ප්‍රධාන ක්‍රියාකාරිත්වයක් ශ්‍රී ලංකාවේ සංදර්භයට සම්බන්ධ කොට විග්‍රහ කරන්න. (ලකුණු 10)

(ii) "අධ්‍යාපනයේ එක් අරමුණක් වන්නේ ළමුන් වැඩ ලෝකයට සූදානම් කිරීමයි." සුදුසු උදාහරණ සමඟින් ඉහත ප්‍රකාශය විස්තර කරන්න. (ලකුණු 10)

(iii) ශ්‍රී ලංකාවේ ශිෂ්‍යයන් වැඩ ලෝකය සඳහා සූදානම් කිරීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටලු තුනක් (03) හඳුනා ගන්න. ඔබ හඳුනාගත් ගැටලු මඟහරවා ගැනීමට ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 13)

03. (i) පවුල් වර්ග දෙක නම් කර, ඒවායේ ලක්ෂණ කෙටියෙන් සංසන්දනය කරන්න. (ලකුණු 06)

(ii) ශ්‍රී ලාංකික සංදර්භයෙන් සුදුසු උදාහරණ උපුටා දක්වමින් න්‍යෂ්ටික පවුලේ කාර්යභාරය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 13)

(iii) ලෝකයේ යෞවන පරම්පරාව අතර ප්‍රචණ්ඩ සංස්කෘතියක් වර්ධනය කිරීමේ දී ජනමාධ්‍යවල භූමිකාව සුදුසු උදාහරණ සහිතව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 14)

04. (i) පෙරදිග හා අපරදිග අධ්‍යාපන දර්ශනයන් පහත මාතෘකා යටතේ කෙටියෙන් සාකච්ඡා කරන්න.

* අධ්‍යාපනයේ අරමුණු
* ගුරුවරයාගේ භූමිකාව (ලකුණු 20)

(ii) අධ්‍යාපනයට අදාළ තිරසාර සංවර්ධන අරමුණ නම් කර, ඒ පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iii) ඉහත අරමුණ සාධනය කර ගැනීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන බාධක මොනවා ද? එම බාධක මඟහරවා ගැනීමට ඔබේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

05. (i) අධ්‍යාපනයේ සමකාලීන ගැටලු **පහක් (05)** ලැයිස්තුගත කරන්න. ඉන් එක් ගැටලුවක් ශ්‍රී ලංකාවේ සංදර්භයට අදාළව විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ශිෂ්‍යයන් අතර සාරධර්ම සංවර්ධනය කිරීමේ දී ශ්‍රී ලංකාව මුහුණ දී ඇති අභියෝග මොනවා ද? (ලකුණු 10)

(iii) ඉහත සඳහන් කරන ලද අභියෝග අවම කර ගැනීමට යෝජනා **හතරක් (04)** ඉදිරිපත් කරන්න. (ලකුණු 13)

06. (i) "සමාජ පංති" සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 06)

(ii) අධ්‍යාපනය සම්බන්ධව ශ්‍රී ලංකාවේ පහළ සමාජ පන්ති ළමුන් මුහුණ දෙන අවාසිදායක තත්ත්වයන් විග්‍රහ කරන්න. (ලකුණු 13)

(iii) ඉන් අවාසිදායක තත්ත්වයන් **දෙකක් (02)** තෝරාගෙන, ඒවා මඟහරවා ගැනීමට ඔබගේ යෝජනා සකස් කරන්න. (ලකුණු 14)

හිමිකම් ඇවිරිණි.